සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 1 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name .................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................

සැ. යු.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 01 සිට 04 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

විදේශ විනිමය අනුපාතය (ඩොලරය) ඉහල යාමත්, ලෝක වෙළඳපොලේ බොරතෙල් බැරලයක මිල ඉහල යාමත් නිසා ඛනිජ තෙල් මිල ඉහළ දැමීමට රජයට සිදුවිය. මේ හේතුවෙන් බොහොමයක් ජනතාව තම ගමන් බිමන් යාම සඳහා පෞද්ගලික බස් රථ හා ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස්රථ යොදා ගැනීමට පෙළඹී ඇත.

01. ඉහත සිද්ධියේ සඳහන් අවශ්‍යතාවයක් වන්නේ,
1. ඛනිජ තෙල් 2. ප්‍රවාහනය 3. ආහාර 4. සන්නිවේදනය

02. බස් රථ අයත් නිෂ්පාදන සාධකය වනුයේ,
1. ප්‍රාග්ධනය 2. ශ්‍රමය 3. භූමිය 4. ව්‍යවසාය

03. A. විදේශ විනිමය අනුපාතය ඉහළ යාම.
B. ඛනිජ තෙල් ආනයනය කිරීම.
C. ඛනිජ තෙල් මිල මට්ටම් ඉහළ යාම.

මෙම සාධක අතරින් ආර්ථික පරිසරයට පමණක් අදාළ සාධක වන්නේ,
1. B ය. 2. C ය. 3. AB ය. 4. AC ය.

04. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,
1. උපයන ලාභයෙන් කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ.
2. විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පණතක් යටතේ පිහිටුවයි.
3. නෛතික පුද්ගලභාවය නොතිබීම.
4. අඛණ්ඩ පැවැත්මක් තිබීම.

05. පහත සඳහන් A තීරුවේ ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්වයද B තීරුවේ ඇල්මක් දැක්වීමට හේතු ද දැක්වේ. ඒවා නිවැරදිව ගැලපූ විට අදාල පිළිතුරු තෝරන්න.

| A | B |
|---|---|
| 1. කලමනාකරුවන් | P. රැකියාවේ සුරක්ෂිතභාවය |
| 2. සේවකයෝ | Q. දී ඇති ණය ආපසු ලබාගත හැකි දැයි දැන ගැනීම |
| 3. ණය දෙන ආයතන | R. ප්‍රමාණවත් ලාභයක් ලැබී තිබේද යන්න. |
| 4. අයිතිකරුවෝ | S. තීරණ ගැනීමේ කටයුතු සඳහා |

1. S R Q P 2. S P R Q 3. R P Q S 4. S P Q R

06. දුම්රිය මගීන්ගේ පහසුව සඳහා මගී ආසන වෙන්කරවා ගැනීමට මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ සිදු කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත.

මෙම සිද්ධියට අදාල ව්‍යාපාර පරිසරය වන්නේ,

1. ස්වාභාවික පරිසරය 2. දේශපාලන පරිසරය 3. තාක්ෂණික පරිසරය 4. භෞතික පරිසරය

07. ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වයට බලපාන ව්‍යාපාරය තුල ක්‍රියාත්මක වන විවිධ පාර්ශව හා සාධක (1)............... පරිසරය ලෙසද, ව්‍යාපාරයෙන් පරිබාහිරව ක්‍රියාත්මක වන පාර්ශවය හා බලවේග (2)...................... පරිසරය ලෙසද හැඳින්විය හැකිය.

ඉහත (1) හා (2) සඳහා සුදුසු පද පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. අභ්‍යන්තර - බාහිර
2. බාහිර - අභ්‍යන්තර
3. අභ්‍යන්තර - ආර්ථික
4. අභ්‍යන්තර - නෛතික

08. පහත සඳහන් ප්‍රකාශන අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. පොලී අනුපාත වැඩි කිරීම නිසා ව්‍යාපාරිකයින් ණය ලබා ගැනීමට වැඩිපුර පෙළඹේ.
2. මිල මට්ටම් ඉහළ යාම නිසා පාරිභෝගිකයින්ට මිලදී ගැනීමේ හැකියාව වැඩිවේ.
3. වැටුප්, ආදායම්, ඉතිරිකිරීම්, ආයෝජන, දේශපාලන පරිසරයට අයත් සාධකයන්ය.
4. රජය ව්‍යාපාර කෙරෙහි නීතිරීති පැනවීමෙන් පාරිභෝගිකයින් ආරක්ෂා වේ.

09. දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමේ අරමුණින් විදේශීය නිෂ්පාදන රට තුළට ගෙන්වීම සීමා කිරීමට රජය ප්‍රතිපත්ති සකස් කිරීම අයත් වන්නේ කුමන ව්‍යාපාර පරිසරයට ද?
1. ආර්ථික පරිසරයටය.
2. දේශපාලන පරිසරයටය.
3. ගෝලීය පරිසරයටය.
4. ප්‍රජා පරිසරයටය.

10. ව්‍යාපාරයක ශක්තියක් වන්නේ,
1. ව්‍යාපාර සඳහා බදු සහන ලබාදීම.
2. පාරිභෝගිකයන්ගේ ජීවන රටාව වෙනස් වීම.
3. පිළිගත් සන්නාම නාමයක් පැවතීම.
4. රජය විසින් අඩු පොලී ණය ක්‍රම හඳුන්වා දීම.

11. පුද්ගලික අංශය සතු ලාභ අරමුණු වූ ව්‍යාපාර සංවිධාන යුගලය ඇතුලත් පිළිතුර වන්නේ,
1. හවුල් ව්‍යාපාර හා සමිති ව්‍යාපාරය
2. තනි පුද්ගල ව්‍යාපාර හා සමූපකාර ව්‍යාපාරය
3. හවුල් ව්‍යාපාර හා සමූපකාර ව්‍යාපාරය
4. තනිපුද්ගල ව්‍යාපාර හා හවුල් ව්‍යාපාරය

12. පෙරේරා සහ සමාගම
1. සංස්ථාපිත සමාගමකි.
2. හවුල් ව්‍යාපාරයකි.
3. රාජ්‍ය සමාගමකි.
4. තනි පුද්ගල ව්‍යාපාරයකි.

13.

| ව්‍යාපාර සංවිධාන නාමය | වගකීම | නීතිමය පුද්ගලභාවය | අඛණ්ඩ පැවැත්ම |
|---|---|---|---|
| කැලණිය විවිධ සේවා සමූපකාර සමිතිය | සීමිතයි | A | ඇත |
| කමිතු රසහල | B | නැත | නැත |
| සීමාසහිත සමිතු සමාගම | සීමිතයි | ඇත | C |

ඉහත වගුවේ A, B, හා C යන ස්ථාන වලට අදාල ලක්ෂණ පිළිවෙලින් දැක්වෙන පිළිතුරු කාණ්ඩය තෝරන්න.
1. ඇත, සීමිතයි, නැත
2. නැත, අසීමිතයි, ඇත
3. ඇත, අසීමිතයි, ඇත
4. නැත, සීමිතයි, නැත

14. ව්‍යාපාර සංවිධාන කිහිපයක් පහත දැක්වේ.

A. හවුල් ව්‍යාපාර B. රාජ්‍ය සමාගම් C. තනි පුද්ගල ව්‍යාපාර D. සමූපකාර ව්‍යාපාර
E. සීමිත සමාගම් F. දෙපාර්තමේන්තු G. රාජ්‍ය සංස්ථා H. සමිති ව්‍යාපාර

මේවා අතුරින් පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධාන පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

1. A, C, G 2. B, E, H 3. D, F, G 4. B, F, G

15. "නීතිමය පුද්ගලභාවයක්" නොමැති ව්‍යාපාර සංවිධාන යුගලය වනුයේ,

1. තනිපුද්ගල ව්‍යාපාර හා සමූපකාර ව්‍යාපාරය 2. තනිපුද්ගල ව්‍යාපාර හා රාජ්‍ය දෙපාර්තුමේන්තුය
3. හවුල් ව්‍යාපාර හා රාජ්‍ය සංස්ථාය 4. සමිති ව්‍යාපාර හා සංස්ථාපිත සමාගමය

16. ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම තුලින් ඇතිකරගත හැකි ප්‍රතිලාභයක් වන්නේ,

1. ව්‍යාපාරය ආදායම් බද්දෙන් නිදහස් වීමයි.
2. නීතිමය පුද්ගලභාවයක් හිමිවීමයි.
3. ව්‍යාපාරයට අනන්‍යතාවයක් හිමිවීමයි.
4. අඛණ්ඩ පැවැත්මක් ඇතිවීමයි.

17. ගිණුම්කරණයේදී ගනුදෙනුවක් ලෙස සැලකිය නොහැකි පිළිතුර තෝරන්න.

1. රු. 50000 ක බඩු තොගයක් ණයට විකිණීම.
2. රු. 10000 ක විදුලි බිලක් මුදලින් ගෙවීම.
3. රු. 15000 ක බඩු තොගයක් විනාශ වීම.
4. රු. 30000 ක මාසික වැටුපකට සේවකයෙකු බඳවා ගැනීම.

Learning Resource Center
R
De Mazenod College
Kandana

තාරුකාගේ ව්‍යාපාරයේ 2023 වර්ෂයට අදාල තොරතුරු කීපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| 2023. 01.01 දිනට ප්‍රාග්ධනය | රු. 350000 |
| 2023 වර්ෂයේ වියදම් | රු. 120000 |
| 2023 වර්ෂයේ ආදායම් | රු. 230000 |
| 2023.07.01 අයිතිකරු යෙදවූ මුදල් | රු. 75000 |

18. 2023.12.31 දිනට තාරුකාගේ හිමිකම වන්නේ,

1. රු. 350000 කි. 2. රු. 360000 කි.
3. රු. 535000 කි. 4. රු. 775000 කි.

19. සචින්ගේ ව්‍යාපාරයේ 2024.10.01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි විය.

වත්කම් = හිමිකම + වගකීම්

375000 = 250000 + 125000

එක්තරා ගනුදෙනුවකින් පසුවද මෙම ගිණුම්කරණ සමීකරණයේ වටිනාකම වෙනස් නොවිය. එම ගනුදෙනුව කුමක්ද?

1. රු. 25000 ක් ණයහිමියන්ට ගෙවීම.
2. විදුලි ගාස්තු රු. 5000 ක් ගෙවීම.
3. රු. 10000 ක බඩු තොගයක් අත්පිට මුදලට ගැනීම.
4. රු. 13000 ක ගොඩනැගිලි කුලී ආදායම් ලැබීම.

20. මනහර රු. 12000 ක බඩු තොගයක් රු. 18000 කට ණයට විකුණුවේය. මෙම ගනුදෙනුව නිසා ඔහුගේ මුළු වත්කම්වල වටිනාකම,

1. රු. 6000 කින් වැඩිවේ. 2. රු. 12000 කින් අඩුවේ.
3. රු. 18000 කින් වැඩිවේ. 4. රු. 30000 කින් වැඩිවේ.

පහත තොරතුරු ඇසුරෙන් අංක 21 සිට 23 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අසංකගේ ව්‍යාපාරයේ 2024 සැප්තැම්බර් මාසය තුළ සිදුවූ ගනුදෙනු කිපයක් පහත දැක්වේ.

A. රු. 20000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම.

B. රු. 10000 ක භාණ්ඩ තොගයක් රු. 15000 කට ණයට විකිණීම.

C. රු. 50000 ක කාර්යාල උපකරණ අත්පිට මුදලට ගැනීම.

D. රු. 10000 ක මුදලක් ණයහිමියෙකුට ගෙවීම.

21. අසංකගේ ව්‍යාපාරයේ වගකීම් වලට බලපාන ගනුදෙනු වන්නේ,

1. A හා B පමණි. 2. A හා C පමණි. 3. B හා D පමණි. 4. A හා D පමණි.

22. මෙම ව්‍යාපාරයේ 2024.09.30 දිනට හිමිකම වැඩිවී ඇත්තේ,

1. රු. 5000 කින්ය. 2. රු. 10000 කින්ය.
3. රු. 15000 කින්ය. 4. රු. 20000 කින්ය.

23. අසංකගේ ව්‍යාපාරයේ 2024.09.01 දිනට මුළු වගකීම් වල වටිනාකම රු. 90000 වූයේ නම් 2024.09.31 දිනට මුළු වගකීම් වල වටිනාකම කොපමණද?

1. රු. 90000 කි. 2. රු. 100000 කි.
3. රු. 110000 කි. 4. රු. 120000 කි.

24. ව්‍යාපාරයක් රු. 150000 ක බැංකු ණයක් ලබා ගැනීමට අදාළ ගනුදෙනුවේ ද්විත්ව බලපෑම වන්නේ,

1. වත්කමක් වැඩිවී හිමිකම වැඩිවීමය. 2. වත්කමක් අඩුවී හිමිකම අඩුවීමය.
3. වත්කමක් වැඩිවී වගකීමක් වැඩිවීමය. 4. වත්කමක් අඩුවී වගකීමක් අඩුවීමය.

25. වැඩිවීම බැර අඩුවීම හර ද්විත්ව සටහන් මූලධර්මය අදාල වන්නේ.

1. වත්කම් හා වියදම් වලට පමණි.
2. වත්කම් හා ආදායම් වලට පමණි.
3. ආදායම්, වියදම් හා වගකීම් වලට පමණි.
4. ආදායම්, හිමිකම් හා වගකීම් වලට පමණි.

26. බැංකු ණය පොළිය රු. 5000 ක් මුදලින් ගෙවීමට අදාල ද්විත්ව සටහන තෝරන්න.

1. මුදල් ගිණුම් හර 5000
   බැංකු ණය ගිණුම බැර 5000
2. බැංකු ණය ගිණුම හර 5000
   මුදල් ගිණුම බැර 5000
3. මුදල් ගිණුම හර 5000
   බැංකු ණය පොළී ගිණුම බැර 5000
4. බැංකු ණය පොළී ගිණුම හර 5000
   මුදල් ගිණුම බැර 5000

27. ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනුවකට අදාල ද්විත්ව සටහන පහත දැක්වේ.

ගැනිලි ගිණුම හර රු. 10000

ගැනුම් ගිණුම බැර රු . 10000

ඉහත ද්විත්ව සටහනට අදාල ගනුදෙනුව වන්නේ,

1. රු. 10000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීමය.
2. රු. 10000 ක භාණ්ඩ තොගයක් අත්පිට මුදලට ගැනීමය.
3. රු. 10000 ක භාණ්ඩ තොගයක් අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීමය.
4. රු. 10000 ක මුදල් අයිතිකරු ප්‍රයෝජනයට ගැනීමය.

පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 28 සිට 30 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ව්‍යාපාරයක ගනුදෙනු සටහන් කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර ලේඛන කිහිපයක් පහත දැක්වේ.

A. ගෙවීම් වවුචරය

B. ගැනුම් ඉන්වොයිසිය

C. තැන්පත් කිරීමේ කුවිතාන්සි

D. ජ' නල් වවුචරය

Learning Resource Center
R
De Mazenod College
Kandana

28. රු. 5000 ක දුරකථන ගාස්තු මුදලින් ගෙවීමට අදාල මූලාශ්‍ර ලේඛනය වන්නේ,
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

29. බැංකු ගිණුමේ ගනුදෙනු සටහන් කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර ලේඛන වන්නේ,
1. A හා B ය. 2. B හා C ය. 3. A හා C ය. 4. B හා D ය.

30. ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 50000 ක් වටිනා කාර්යාල උපකරණ ණයට ගැනීමට අදාල මූලාශ්‍ර ලේඛනය වන්නේ,
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

24107

සඳුන්ගේ ව්‍යාපාරයේ සුළු මුදල් සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| 2024.09.01 දිනට සුළු මුදල් ශේෂය | රු. 300 |
| 2024.09.01 දිනට අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම | රු. 4700 |
| 2024.09.30 දිනට සුළු මුදල් ශේෂය | රු. 400 |

31. ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම හා සැප්තැම්බර් මාසයේ සුළු මුදල් වියදම පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. රු. 4700, රු. 300
2. රු. 5000, රු. 4600
3. රු. 5000, රු. 4700
4. රු. 5700, රු. 4700

32. කාලිංගගේ ව්‍යාපාරය විසින් ණය හිමියෙකුට නිකුත් කරන ලද රු. 12000 ක් වටිනා චෙක්පත අගරු වීමට අදාල ද්විත්ව සටහන දැක්වෙන පිළිතුර කුමක්ද?
1. බැංකු ගිණුම හර 5000
   ණය හිමි ගිණුම බැර 5000
2. බැංකු ගිණුම හර 5000
   මුදල් ගිණුම බැර 5000
3. ණය හිමි ගිණුම හර 5000
   බැංකු ගිණුම බැර 5000
4. ණය හිමි ගිණුම හර 5000
   මුදල් ගිණුම බැර 5000

33. ද්විත්ව කාර්යයක් ඉටුකරන මූලික සටහන් පොත් යුගලය තෝරන්න.
1. මුදල් පොත හා ගැනුම් ජ'නලය
2. මුදල් පොත හා පොදු ජ'නලය
3. ගැනුම් ජ'නලය හා විකුණුම් ජ'නලය
4. මුදල් පොත හා සුළු මුදල් පොත

පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 34 හා 35 ට පිළිතුරු සපයන්න.

විවේකාගේ ව්‍යාපාරයේ 2024 මැයි 31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 20000 ක් විය. පහත හේතු නිසා එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය ඊට වඩා වෙනස් විය.

A. තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත් රු. 12000

B. ණය ගැතියෙකු කෙලින්ම බැංකුවට එවා තිබූ ප්‍රේෂණ රු. 8000

C. ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති රක්ෂණ වාරිකය රු. 10000

34. ඉහත හේතු අතරින් බැංකු ගිණුමේ ශේෂයට වඩා බැංකු ප්‍රකාශනයේ ශේෂය අඩුවීමට බලපාන හේතුව/ හේතු වන්නේ.

1. A පමණි. 2. B පමණි. 3. A හා C පමණි. 4. B හා C පමණි.

35. ව්‍යාපාරයේ 2024 මැයි 31 දිනට සංශෝධිත බැංකු ශේෂය කොපමණද?

1. රු. 18000 කි.
2. රු. 20000 කි.
3. රු. 22000 කි.
4. රු. 30000 කි.

36. පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයේ අවාසියක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. ශ්‍රමය අවම වීම තුළින් මුදල් ඉතිරි වීම.
2. කාලීන දත්ත පහසුවෙන් ලබා ගත හැකි වීම.
3. මෘදුකාංග මිලදී ගැනීමට විශාල මුදලක් වැය වීම.
4. ගිණුම් වාර්තාවල නිවැරදි භාවය ඉහළ වීම.

37. විකුණුම් ජ'නලයේ සටහන් කල ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමට අදාල ද්විත්ව සටහන කුමක්ද?

1. විකුණුම් ගිණුම හර
 ණය හිමි ගිණුම බැර
2. ණයගැති ගිණුම හර
 විකුණුම් ගිණුම බැර
3. ණය හිමි ගිණුම හර
 විකුණුම් ගිණුම බැර
4. විකුණුම් ගිණුම හර
 ණයගැති ගිණුම බැර

38. ව්‍යාපාරයක ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව රු. 340000 ක් වූ අතර බැර තීරුවේ එකතුව රු. 355000 ක් විය. මෙම වෙනස අවිනිශ්චිත ගිණුමේ දැක්වෙන්නේ.

1. රු. 15,000 ක් ලෙස බැර පැත්තේය.
2. රු. 15,000 ක් ලෙස හර පැත්තේය.
3. රු. 340,000 ක් ලෙස හර පැත්තේය.
4. රු. 355,000 ක් ලෙස බැර පැත්තේය.

39. ශේෂ පිරික්සුමේ සමානතාවයට බලපෑමක් ඇතිකරන ගිණුම්කරණ වැරැද්ද තෝරන්න.

1. රු. 12000 ක ගැනුම් ඉන්වොයිසියක් පොත්වලින් මගහැරීම
2. රු. 20000 ක් ණය හිමියන්ට ගෙවීම ගිණුම්වල දෙවරක් සටහන් වීම.
3. රු. 5000 ක දුරකථන ගාස්තු ගෙවීම මුදල් පොතේ පමණක් සටහන් වීම.
4. ණය ගැතියෙකුගෙන් ලැබුණු රු. 6500 ක මුදල ගිණුම් වල රු. 5600 ක් ලෙස සටහන් වීම.

40. ව්‍යාපාරයක රු. 7000 ක විදුලි ගාස්තු ගෙවීම විදුලි ගාස්තු ගිණුමට රු. 700 ක් ලෙස හර කර තිබීමේ වරද නිවැරදි කිරීමට අදාල ජ'නල් සටහන කුමක්ද?

1. විදුලි ගාස්තු ගිණුම හර 6300
 මුදල් ගිණුම බැර 6300
2. විදුලි ගාස්තු ගිණුම හර 6300
 අවිනිශ්චිත ගිණුම බැර 6300
3. විදුලි ගාස්තු ගිණුම හර 7000
 මුදල් ගිණුම බැර 7000
4. විදුලි ගාස්තු ගිණුම හර 7000
 අවිනිශ්චිත ගිණුම බැර 7000

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource Center R De Mazenod College Kandana

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 2 යි |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. පහත දැක්වෙන සිද්ධිය ඇසුරින් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශ්‍රී ලංකා මොරටුව විශ්ව විද්‍යාලයේ විදුලි ඉංජිනේරු උපාධිධාරියෙකු වූ ආලෝක දීප්ති මහතා විදුලි අර්බුදයට පිළියමක් ලෙස විදුලිය විසන්ධි කරන ලද අවස්ථාවලදී නැවත ආරෝපනය වන (Rechargeble) විදුලි බල්බ නිපදවා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් "ආලෝක බල්බ්" නමින් 2024.01.01 දින ආරම්භ කරනු ලැබීය. එදින ඔහු සතු රු.500,000 ක මුදල්ද රු. 250,000 ක් වටිනා උපකරණද ව්‍යාපාරයට යෙදවූ අතර එදිනම ලංකා බැංකුවෙන් රු. 400,000 ක බැංකු ණයක්ද ලබා ගන්නා ලදී. බල්බ් නිෂ්පාදන කටයුතු සඳහා පලපුරුදු සේවකයින් දෙදෙනෙකුද බඳවාගත් අතර 2024 මාසය තුල පහත ගනුදෙනු සිදුවිය.

| | | |
|---|---|---|
| 2024.01.05 | අමුද්‍රව්‍ය මිලට ගැනුම් | රු. 200,000 |
| 2024.01.07 | වරිපනම් බදු | රු. 10,000 |
| 2024.01.15 | සේවක වැටුප් | රු. 50,000 |
| 2024.01.20 | විදුලිය වියදම් | රු. 5,000 |
| 2024.01.22 | ඇසුරුම් පෙට්ටි සඳහා වියදම් | රු. 15,000 |
| 2024.01.23 | බෙදාහැරීමේ හා අලෙවි වියදම් | රු. 50,000 |
| 2024.01.25 | කුඩා යන්ත්‍රයක් මිලදී ගැනීම | රු. 50,000 |
| 2024.01.26 | බැංකු ජංගම ගිණුමක් ආරම්භ කිරීම | රු.100,000 |
| 2024.01.28 | විදුලිබල්බ විකුණුම් ආදායම | රු. 500,000 |

දිනෙන් දින ව්‍යාපාරය දියුණුවට පත්වන බැවින්, විශාල ප්‍රාග්ධනයක් සහිතව, වගකීම සීමිත වූ ව්‍යාපාරයක් ලෙස තම ව්‍යාපාරය පවත්වා ගෙන යාමට ආලෝක දීප්ත මහතා අදහස් කරයි.

i. (අ) "ආලෝක බල්බ්" අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද? (ල. 01).
(ආ) එම ව්‍යාපාර සංවිධානයේ වාසි හා අවාසි එක බැගින් ලියන්න. (ල. 01)

ii. (අ) "ආලෝක බල්බ්" ව්‍යාපාරයේ නිෂ්පාදිත වල ස්වභාවය අනුව කවර වර්ගයේ ව්‍යාපාරයක් ද? (ල. 01)
(ආ) මෙම ව්‍යාපාරයට අයත් නිෂ්පාදන සාධක දෙකක් සිද්ධිය ඇසුරින් උදාහරණ සහිතව නම් කරන්න. (ල. 01)

iii. (අ) "ආලෝක බල්බ්" ව්‍යාපාරයේ ශක්තියක් හා අවස්ථාවක් සිද්ධිය ඇසුරින් නම් කරන්න. (ල. 01)
(ආ) "ආලෝක බල්බ්" ව්‍යාපාරය ලියාපදිංචිය පිළිබඳ ඔබගේ අදහස දක්වන්න. (ල. 01)

iv. (අ) ලංකා බැංකුව කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත් වේද? (ල. 01)
(ආ) ආලෝකගේ අදහස වනුයේ මෙම ව්‍යාපාරය ඉදිරියේ දී කුමන ව්‍යාපාර සංවිධානයක් ලෙස පවත්වාගෙන යාමටද? (ල. 01)

v. 2024.01.01 දිනට මෙම ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව ලියා දක්වන්න. (ල. 02)

vi. ''ආලෝක බල්බ්'' ව්‍යාපාරයේ ජංගම නොවන වත්කමක් හා ජංගම නොවන වගකීමක් අගයන් සහිතව දක්වන්න. (ල. 02)

vii. ඉහත ව්‍යාපාරය භාවිතා කරන මූලික සටහන් පොත් දෙකක් හා ඊට අදාල මූලාශ්‍ර ලේඛන දෙකක් නම් කරන්න. (ල. 02)

viii. (අ) 2024.01.26 දිනට අදාල ගනුදෙනුවේ ද්විත්ව සටහන් අගයන් සහිතව ලියා දක්වන්න. (ල. 01)
(ආ) මෙම ව්‍යාපාරයේ අයිතිකරුගේ හිමිකම අඩුවීමට බලපාන ගනුදෙනු දෙකක් නම් කරන්න. (ල. 01)

ix. ඉහත ව්‍යාපාරයේ සිදුවී ඇති ගනුදෙනු අතුරින් පහත සඳහන් අයිතම සඳහා නිදසුන බැගින් වටිනාකම් සහිතව ලියා දක්වන්න.
(අ) වත්කම් = ..................................... (ආ) වගකීම් = .....................................
(ඉ) වියදම් = ..................................... (ඊ) ආදායම් = ..................................... (ල. 02)

x. ''ආලෝක බල්බ්'' ව්‍යාපාරයේ 2024.01.31 දිනට මුදල් ශේෂය කොපමණද? (ල. 02)

(මුළු ලකුණු 20යි)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

02. i. (අ) ව්‍යාපාරයක් යන්න නිර්වචනය කරන්න. (ල. 01)
(ආ) අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් දෙකක් ලියන්න. (ල. 01)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.
(අ) ව්‍යාපාරයක ප්‍රධාන අරමුණ ලාභ ලැබීම වේ. (   )
(ආ) ව්‍යාපාරයක බාහිර පරිසරය ව්‍යාපාරයට පාලනය කල හැකිය. (   )
(ඉ) කළමනාකරුවන් ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දක්වන්නේ තීරණ ගැනීම හා තීරණ ක්‍රියාත්මක කිරීම සඳහාය. (   )
(ඊ) මුදල් නිෂ්පාදන සාධකයක් වන ප්‍රාග්ධනයට අයත් වේ. (   ) (ල. 02)

iii. අසංක කුමාර විසින් ''සමනල'' නමින් පාසල් පොත් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පාසලක් අසල ආරම්භ කලේය. එම ව්‍යාපාරයට පොත් සපයන ලද්දේ රිවඩ් විසිනි. ප්‍රියංකා මෙම ව්‍යාපාරයේ සේවකයෙකු ලෙස බඳවා ගන්නා ලදී. පාසල් සිසුන් විශාල පිරිසක් දිනපතා පොත් මිලදී ගැනීමට මෙම වෙළඳසැලට පැමිණෙති.
(අ) ඉහත සිද්ධියට අදාල ව්‍යාපාරික අවස්ථාවක් නම් කරන්න. (ල. 01)
(ආ) ඉහත ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව දෙකක් සඳහා නිදසුන් දෙකක් සිද්ධිය ඇසුරින් ලියන්න. (ල. 01)

iv. (අ) භාණ්ඩ හා සේවා අතර දැකිය හැකි වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ල. 01)
(ආ) ඇල්මැති පාර්ශවයක් ලෙස ''රජය'' ව්‍යාපාර වලින් අපේක්ෂිත අරමුණු දෙකක් සඳහන් කරන්න. (ල. 01)

(මුළු ලකුණු 08යි)

03. i. (අ) ව්‍යාපාර අභ්‍යන්තර පරිසරය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල. 01)

(ආ) ආර්ථික පරිසර සාධකයක් වන විදේශ විනිමය අනුපාතිකය යනු කුමක්ද? (ල. 01)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

(අ) තරඟකරුවන් බිහිවීම ව්‍යාපාරයකට තර්ජනාත්මකව බලපායි. ( )

(ආ) නව සොයා ගැනීම්, දුරකථන, පරිඝනක වැනි සාධක අයත් වන්නේ තාක්ෂණික පරිසරයටය. ( )

(ඉ) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ව්‍යාපාරයට අනන්‍යතාවයක් ලැබේ. ( )

(ඊ) විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑමකි. ( )

(ල. 02)

iii. (අ) තාක්ෂණික වෙනස්වීම් නිසා ව්‍යාපාර වල සිදුවූ වෙනස්කම් දෙකක් නම් කරන්න. (ල. 01)

(ආ) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑම් දෙකක් ලියන්න. (ල. 01)

iv. (අ) අයිතිය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන ප්‍රධාන ආකාර දෙක නම් කරන්න. (ල. 01)

(ආ) මහපරිමාණ ව්‍යාපාර වල දැකිය හැකි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 01)

(මුළු ලකුණු 08යි)

04. i. (අ) ප්‍රමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය කිරීමේ දී යොදාගනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායක දෙකක් ලියන්න. (ල. 01)

(ආ) තනි පුද්ගල ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර අතර සමානකමක් හා අසමානකමක් ලියා දක්වන්න. (ල. 01)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

(අ) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් සංඛ්‍යාව 2 - 20 ක් විය යුතු බව 2007 අංක 07 සමාගම් පණතෙහි දක්වා ඇත. ( )

(ආ) සංස්ථාපිත සමාගමක කොටස්කරුවන් මිලදීගත් කොටස්වල වටිනාකමට පමණක් ඔවුන්ගේ වගකීම සීමා නොවේ. ( )

(ඉ) සමුපකාර සමිතියක ආරම්භක අවම සාමාජික සංඛ්‍යාව දහයකි. ( )

(ඊ) පොල් සංවර්ධන අධිකාරිය රාජ්‍ය සංස්ථාවකි. ( )

(ල. 02)

iii. (අ) සමුපකාර සමිති ව්‍යාපාර සංවිධානවල දක්නට ලැබෙන දුර්වලතා දෙකක් නම් කරන්න. (ල. 01)

(ආ) සමිති ව්‍යාපාර වල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල. 01)

iv. (අ) රාජ්‍ය දෙපාර්තමේන්තු ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ දැකිය හැකි වාසි සහගත හා අවාසි සහගත කරුණු එක බැගින් ලියන්න. (ල. 01)

(ආ) රාජ්‍ය සංස්ථාවල දැකිය හැකි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 01)

(මුළු ලකුණු 08යි)

## II කොටස - ගිණුම්කරණ අධ්‍යයනය

**(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)**

05. i. (අ) ව්‍යාපාරික ගනුදෙනුවක් යනු කුමක්ද? (ල. 01)
(ආ) වගකීමක ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 01)

ii. සාරංගගේ ව්‍යාපාරයේ 2024.01.01 දිනට පහත සඳහන් ශේෂ දක්නට ලැබිණි.

| | |
|---|---|
| ලී බඩු හා උපකරණ | රු. 200,000 |
| භාණ්ඩ තොගය | රු. 50,000 |
| ණය ගැතියෝ | රු. 30,000 |
| මුදල් | රු. 20,000 |
| බැංකු ණය | රු. 100,000 |
| ණයහිමියෝ | රු. 25,000 |

(අ) 2024.01.01 දිනට සාරංගගේ හිමිකම කොපමණද?
(ආ) 2024.01.01 දිනට ව්‍යාපාරයේ ජංගම වත්කම් වල මුළු වටිනාකම කොපමණද? (ල. 02)

iii. සුධාරක විසින් 2024.03.01 දින ආරම්භ කළ ව්‍යාපාරයේ පළමු සතිය තුළ සිදුවූ ගනුදෙනු පහත දැක්වේ.

2024.03.01 රු. 250,000 ක ප්‍රාග්ධනය යෙදවීම.
2024.03.02 රු. 100,000 ක බැංකු ණයක් ගැනීම.
2024.03.03 රු. 50,000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම.
2024.03.05 රු. 25,000 ක භාණ්ඩ තොගයක් රු. 30,000 ට ණයට විකිණීම.
2024.03.07 රු. 10,000 ක් ගොඩනැගිලි කුලී මුදලින් ගෙවීම.

අවශ්‍ය වන්නේ.

එක් එක් දිනයේ සිදුවී ඇති ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත වගුව භාවිතා කරමින් දැක්වීම. (ල. 04)

පළමු ගනුදෙනුව නිදසුනක් ලෙස දක්වා ඇත.

| දිනය | වත්කම් | | | = හිමිකම | + වගකීම් | |
|---|---|---|---|---|---|---|
| | භාණ්ඩ තොගය | ණය ගැතියෝ | මුදල් | හිමිකම | බැංකු ණය | ණය හිමියෝ |
| 1 | | | + 250,000 | + 250,000 | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 5 | | | | | | |
| 7 | | | | | | |

iv. (අ) පහත සඳහන් ගනුදෙනු වලට අදාල ද්විත්ව සටහන් ලියන්න.
1. අයිතිකරු රු. 5000 ක භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.
2. රු. 15,000 ක් බැංකු ණය පියවීම. (බැංකු ණය රු. 15,000 ක් ආපසු ගෙවීම.)

(ආ) පහත දැක්වෙන ද්විත්ව සටහන් වලට අදාල ගනුදෙනු ලියන්න.
1. ගැනුම් ගිණුම හර රු. 10,000
ණය හිමි ගිණුම බැර රු. 10,000
2. දුන් වට්ටම් ගිණුම හර රු. 2,000
ණය ගැති ගිණුම බැර රු. 2,000 (ල. 04)

(මුළු ලකුණු 12)

06. i. (අ) මූලික සටහන් පොත් යනු කුමක්ද?

(ආ) ලදුපතක ඇතුළත් කරුණු දෙකක් ලියන්න. (ල. 02)

24107

Learning Resource Center
R
De Mazenod College
Kandana

ii. කාංචනගේ ව්‍යාපාරයේ 2024.01.01 දිනට පහත ශේෂයන් පැවතුණි.

| | |
|---|---|
| මුදල් ශේෂය | රු. 50,000 |
| ණයගැති ශේෂය | රු. 7,000 |
| ණය හිමි ශේෂය | රු. 5,000 |

ජනවාරි මාසය තුළ පහත ගනුදෙනු සිදුවිය.

- 2024.01.08 ණයගැතියන්ගෙන් 5% ක වට්ටම් අඩුකොට මුදල් ලැබීම.
- 2024.01.12 ණයහිමියන්ට මුදල් ගෙවීමේදී රු. 400 ක වට්ටමක් ලැබීම.

අවශ්‍ය වන්නේ,

ඉහත ගනුදෙනු වට්ටම් තීරු සහිත මුදල් පොතක සටහන් කර මුදල් පොත තුලනය කිරීම. (ල. 02)

iii. මාසිකව රු. 3000 ක සුළු මුදල් අග්‍රිමයක් පවත්වාගෙන යන අනුහස්ගේ ව්‍යාපාරයේ 2024 මැයි 01 දිනට සුළු මුදල් පොත පහත දැක්වේ.

සුළු මුදල් පොත

| ලැබීම් | ස/ෆු | දිනය | විස්තරය | වවු. අං. | ගෙවීම් | විශ්ලේෂණ තීරු | | | | ලෙජර් ගිණුම | ලෙ. පි. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ගමන් වියදම් | තැපැල් වියදම් | ලිපිද්‍රව්‍ය වියදම් | විවිධ වියදම් | | |
| 550 | | 05/01 | ශේෂය ඉ/ගෙ | | | | | | | | |

මැයි මාසය තුළ පහත ගනුදෙනු සිදුවිය.

5/01 අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම.

5/05 ත්‍රිරෝද රථ ගාස්තු රු.400

5/10 පෑන් සහ අභ්‍යාස පොත් සඳහා රු.300

5/15 සංග්‍රහ සඳහා වියදම් රු.500

5/18 සමන්ට ගෙවීම් රු.700

5/22 මුද්දර සඳහා ගෙවීම් රු.200

5/25 කුලී රථ වියදම් රු.600

6/01 අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම

අවශ්‍ය වන්නේ,

ඉහත ගනුදෙනු සුළු මුදල් පොතක සටහන් කර 2024.06.01 දිනට වියදම් ප්‍රතිපූර්ණය දැක්වීම. (ල. 04)

iv. තරුෂිගේ ව්‍යාපාරයේ 2024.09.30 දිනට බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු. 17,000 වූ අතර එදිනට බැංකුවෙන් එවන ලද බැංකු ප්‍රකාශයේ රු. 16,000 ක් විය. වෙනසට හේතු ලෙස පහත කරුණු අනාවරණය කරගන්නා ලදී.

- ස්ථාවර නියෝග මත බැංකුව විසින් ගෙවා ඇති රක්ෂණ වාරිකය රු. 8000
- නිකුත්කළ නමුත් මාසය තුළ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම රු. 20,000 කි.
- තැන්පත් කළ නමුත් මාසය තුළ නිශ්කාෂනය නොවූ චෙක්පත් වල වටිනාකම රු. 25,000 කි.
- ණය ගැතියෙකු විසින් බැංකුවට එවා ඇති ප්‍රේෂණ වල වටිනාකම රු. 12,000

අවශ්‍ය වන්නේ,

(අ) 2024.09.30 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.

(ආ) 2024.09.30 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම. (ල. 04)

(මුළු ලකුණු 12)

07. i. (අ) පරිගණක ආශ්‍රිත ගිණුම්කරනයේ වාසි දෙකක් ලියන්න.

(ආ) ටෙලි බැංකු සේවා තුළින් ව්‍යාපාරිකයෙකුට ඉටුකරගත හැකි කාර්යයන් දෙකක් ලියන්න. (ල. 02)

ii. (අ) බැංකු ගිණුමේ හර පැත්තේ සටහන් කරන ගනුදෙනු දෙකක් ලියන්න.

(ආ) පොදු ජ'නලයක සටහන් කරන ගනුදෙනු දෙකක් ලියන්න. (ල. 02)

iii. තරංගගේ ව්‍යාපාරයේ 2024 අගෝස්තු මාසයේ ණයට භාණ්ඩ ගැනුම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | අනෙකුත් තොරතුරු |
|---|---|---|---|
| 2024/06/05 | 284 | නිමාලි ප්‍රින්ටර්ස් | රු. 1000 බැගින් A4 කඩදාසි පැකට් 30 යි. (අඩු කළ වෙළඳ වට්ටම 10%) |
| 2024/06/17 | 302 | ලක්දෙරණ ට්‍රේඩර්ස් | පොතක් රු.150 බැගින් අභ්‍යාස පොත් 300යි. (අඩු කළ වෙළඳ වට්ටම 10%) |

අවශ්‍ය වන්නේ,

ඉහත තොරතුරු ඇසුරින් තරංගගේ ව්‍යාපාරයේ ගැනුම් ජ'නලය පිළියෙල කිරීම. (ල. 04)

iv. අනුපමගේ ව්‍යාපාරයේ 2024.12.31 දින පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර හා බැර තීරු වල එකතුව සමාන නොවූ හෙයින් වෙනස වූ රු.15,000 අවිනිශ්චිත ගිණුමට බැර කරන ලදී. පසුව සිදුකළ ගිණුම් පරීක්ෂාවේදී පහත දැක්වෙන වැරදි අනාවරණය කරගන්නා ලදී.

1. රු. 12,000 ක ගැනුම් ඉන්වොයිසියක් පොත්වලින් මගහැරී ඇත.
2. ණය ගැතියෙකුගෙන් ලැබු රු.18,000 ක මුදල මුදල් පොතේ පමණක් සටහන්ව ඇත.
3. රු. 3300 ක දුරකථන ගාස්තු චෙක්පතකින් ගෙවීම දුරකථන ගාස්තු ගිණුමේ රු.300 ලෙස සටහන් කර ඇත.
4. රු. 5000 ක විදුලි වියදම් ගෙවීම වැරදීමකින් විවිධ වියදම් ගිණුමට හර කර ඇත.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත වැරදි අතුරින් ශේෂ පිරික්සුමේ සමානතාවයට බලපාන වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන් පොදු ජ'නලයේ දැක්වීම.

(ආ) අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීම. (ල. 04)

(මුළු ලකුණු 12)